DOI : 10.31357/fhssmst.1998.00677

# ශ්‍රී ලංකාවේ අධිකරණමය කටයුතු වලදී නීතීඥවරයා සතු කාර්යභාරය පිළිබඳ අපරාධ විද්‍යාත්මක විමර්ශණයක්

(තෝරා ගනු ලැබූ මහේස්ත්‍රාත් හා මහාධිකරණ කිහිපයක් ඇසුරෙන්)

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය.


| | | |
|---|---|---|
| නම | - | සුනිල් රාජනෙත්ති |
| ලියාපදිංචි අංකය | - | 19377 |
| වර්ෂය | - | 1998 |

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ගංගොඩවිල
නුගේගොඩ

# පළමු පරිච්ඡේදය

## හැඳින්වීම

### 1-1 අධ්‍යයනයේ වැදගත්කම.

අපරාධ (Crime) , අපචාර (Delinquency ) අපරාධ වලට පෙළඹෙන්නන් (Recidivist), වෘත්තියක් වශයෙන් අපරාධ කරන්නන් (Professional Criminals) පිළිබඳ අධ්‍යයනය කළ යුතු අවධියක අපි සිටිමු. විශේෂයෙන් සුපිරි අපරාධ (Super Crime), නූතන අපරාධ (Modern Crime) පිළිබඳ නව ප්‍රවණතාවයක් ශ්‍රී ලංකාවේ අපරාධ පිළිබඳ සංඛ්‍යාලේඛණ වලින් පවා සැගව ඇත. අපරාධ වලට ගොදුරු වන්නන් සහ ඔවුන්ගේ පවුල් පිළිබඳ ගැටළු බරපතල සමාජ ප්‍රශ්ණ ගණනාවකට හේතු වී ඇත. රටෙහි සාමාන්‍ය ජනතාවගේ අපරාධ වලට ලැබුණු දඩුවම් පිළිබඳ බිය තුරන් වී ගොස් ඇත. එබැවින් රටෙහි සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතය විශාල පීඩනයකට පත් කරමින් අපරාධ (Crime) පිළිබඳ බිය හැම පුරවැසියෙකුම තුළ ජනිත කොට ඇත. මේ පිළිබඳව විෂයානුබද්ධ හෝ න්‍යායාත්මක පදනමකින් ප්‍රායෝගිකව කරන ලද අධ්‍යයනයන් අතලොස්සක් පමණක් දැකිය හැකි වේ. එවැනි අධ්‍යයනයන් කළ අය අතර මහාචාර්ය නන්දසේන රත්නපාල, ආචාර්ය ඒ.ආර්.බී.එම්. අමරසිංහ, ආචාර්ය එච්.ඩබ්. ජයවර්ධන, මහාචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල, මහාචාර්ය පී.ඇල්. පීරිස් හා එච්.ඩබ්ලිව්. තම්බයියා යනාදි වියතුන් විසින් තම තමන් නියැලී සිටින ක්ෂේත්‍රයන් කෙරෙහි පමණක් අවධානය යොමු කොට එම අධ්‍යයනයන් සිදු කර ඇත. විශේෂයෙන් මේ පර්යේෂණය නෛතික පදනමකින් හා න්‍යායාත්මක පදනමකින් හෝ කරනු ලබු අධ්‍යයනයන් වේ. සමාජ විද්‍යාත්මක හෝ අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන් තුළින් කරනු ලැබූ පර්යේෂණ දුර්ලභ අවධියක මෙවැනි පර්යේෂණයක් සඳහා අවධානය යොමු කිරීම විශේෂ වැදගත්කමකින් යුක්ත විය හැක.

ජාත්‍යන්තර වශයෙන් මේ ක්ෂේත්‍රයේ විවිධ මාතෘකා ඔස්සේ පර්යේෂණ සිදුව ඇත. සමාජ විද්‍යාඥයින්, අපරාධ විද්‍යාඥයින් හා අපරාධ යුක්තිය පිළිබඳ විශේෂඥයින් කර ඇති පර්යේෂණ ජාත්‍යන්තර කීර්තියට පත් වුවා පමණක් නොව ඒ ඒ රටවල අපරාධ පිළිබඳ බිය අවම කිරීමේ ප්‍රායෝගික ප්‍රයත්නය සඳහා පිටුවහලක් වී ඇත. හාග්‍රීව්ස් (Hargreaves 1963). විසින් නීතිඥ වෘත්තිය යුරෝපයෙහි විකාශනය වූ අයුරු ගැඹුරින් විස්තර කරනු ලැබුවේය. බර්ක්ස් මයිකල් නීතියේ මහත්මයා (Gentleman of the Law ) යන ග්‍රන්ථය මගින් නීතිඥවරයා විසින් සිය කාර්ය භාරය තුලින් කරනු ලබන සේවය විග්‍රහ කර ඇත. ලෙට් (Leat) විසින් රචනා කරන ලද දුප්පත් "මිනිසාගේ නීතිඥවරයාගේ කාර්ය භාරය හා එහි නැගීම" (The Rise and the Role of the Poor man's lawyer) යන ලිපිය මගින් නීතිඥවරුන්ගේ සේවය, විශේෂයෙන් දුප්පත් මිනිසුන්ට වැදගත් වන ආකාරය පෙන්වා දෙනු ලැබීය. පොඩ්මෝර් (Podmore,1977) සිය ලිපිය මගින් නීතිඥවරයා හා දේශපාලනය (Lawyer and Politics) පිළිබඳ පවතින සබඳතාව ගැඹුරින් සාකච්ඡා කළේය. රොසෙන්තල් (Rosenthal,1974) විසින් පෙන්වා දුන් පරිදි නීතිඥවරයා හා සේවාදායකයා (Lawyer and Client) අතර සිදුවන සම්බන්ධතාවයේ ස්වභාවය ගැඹුරින් සාකච්ඡා කරන්නට යෙදිනි. මේ විද්‍යාඥයින් ට පෙර නීති

වෘත්තිය අධිකරණ ක්‍රියාදාමය පිළිබඳව රචනා කළ සමාජ විද්‍යාඥයින් ලෙස මැක්ස් වේබර් (Max Weber ) එමිල් ඩර්කයිම් (Emile Durkheim) අර්ලිච් (Ehrlich) ජෙනි (Geny) පෂුගානිස් (Pashukanis) පෙට්‍රස්කි (Petrazycki) හන්ට් (Hunt) ටස්නට් (Tushnet) රොස්කො පවුන්ඩ් (Rosko Pound) ටොමැෂික් (Tomasic) එඩ්වින් සදර්ලන්ඩ් (Edwin Sutherland) ඩොනල්ඩ් ආර් ක්‍රිසි ( Donald R.Cressey) ආදී සමාජ විද්‍යාඥයින් මෙන්ම අපරාධ විද්‍යාඥයින් විවිධ මාතෘකා ඔස්සේ පර්යේෂණ සිදු කොට ඇත.

නූතන අපරාධ විද්‍යාඥයන් ලෙස, නීතිඥ වෘත්තිය අධිකරණය, අධිකරණ ක්‍රියාදාමය, පොලිසිය, බන්ධනාගාර, පරිවාස හා දණ්ඩණවේදය පිළිබඳ අපරාධ විද්‍යාත්මකව අධ්‍යයනය කොට ප්‍රායෝගික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා මග පෙන්වනු ලැබීය. නූතන අපරාධ යුක්තිය පිළිබඳ විද්‍යාඥයින් ලෙස ජාත්‍යන්තර කීර්තියට පත් පහත සඳහන් අය විසින් මෙම ක්ෂේත්‍රයේ කාලීන ගැටළු පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයන් පුළුල් ක්ෂේත්‍රයක දියත් කොට ඇත. එම විද්‍යාඥයින් අතර ඇන්ඩෘ වොන් හර්ෂ් (Andrew Von Hirsh, 1969) ජේම්ස් කිව් විල්සන් (James Q Wilson, 1968) ඩොනල්ඩ් ආර් ක්‍රිසි (Donald R. Cressey, 1973) මර්වින් ඊ. වුල්ෆ් ගෑංග් (Marvin E Wolfgang 1974) රොබට් එම් රොගෙල් (Ronert M Kegoil) එරික් ඩී පූල් (Eric D Poole 1979) ආදීන් අද වන විට ලෝකයේ ප්‍රකට අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ විද්වතුන් ලෙස ප්‍රචලිත වී සිටිති. අපරාධ යුක්ති පරිපාලන පද්ධති පිළිබඳ සංකල්පය ලොව පුරා ව්‍යාප්ත වෙත්ම නීතිඥවරයා අන්තර්ගත අධිකරණ ක්‍රමය පිළිබඳ සිදු වී ඇති පර්යේෂණ ඉතා විශාල වේ. මේ කරුණු පිළිබඳ කෙටියෙන් හෝ අවධානය යොමු කරනු ලැබුවේ අපේ රටේ මේ පිළිබඳ පර්යේෂණ කිරීමට තිබෙන උදාසීන භාවය මග හැරවීම සඳහාත් එවැනි පර්යේෂණයන් වල ඇති වැදගත්කම පෙන්වා දීමත් අරමුණු කර ගෙනය.

මෙරටෙහි නීතිඥ වෘත්තිය පිළිබඳව අපරාධ විද්‍යාත්මකව කිසිදු අධ්‍යයනයක් නොතිබෙන අවධියක මෙවැනි අධ්‍යයනයක් කිරීම ඉතා වැදගත් වනු ඇත. ඉදිරි කාලයේ දී ප්‍රවීණයන් නොව ආධුනිකයන් සඳහා යම් ආකාරයක මග පෙන්වීමක් මෙමගින් සිදු වේ. වර්තමාන සමාජයේ නඩු මගට පිවිසී සිටින විශාල ජනකායගේ ගැටළු වල ස්වභාවය හඳුනාගෙන එවා මග හරවා ගෙන සමාජ සුභ සිද්ධිය සඳහා ප්‍රතිපත්ති සැලසුම් කරන්නන් සඳහා ද මෙය වැදගත් වේ. අපරාධ පාලනය සඳහා නෛතික උපාය මාර්ග කෙරෙහි බලාපොරොත්තු තබමින්ම ගැටලු විසඳීමට කටයුතු කරන අපරාධ යුක්ති විසර්ජන නිලධාරීනට සමාජය පිළිබඳ ආපසු හැරී බැලීමට අවධානය යොමු කිරීම තවත් වැදගත්කමක් වනු ඇත. අපරාධ වලට ගොදුරු වන්නන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් මුහුණ දෙන ගැටළු, විත්තිකරුගේ බිරිඳ ඇතුළු දරුවන් මුහුණ පාන ප්‍රශ්ණ හඳුනා ගැනීමට කාලය එළඹ ඇති බව මෙමගින් පෙන්වා දෙනු ලැබේ.

නීතිඥ වෘත්තිය හා නීතිඥ කාර්යභාරය පිළිබඳ කිසිදු පර්යේෂණයක් නොකිරීමෙන් ඔවුන්ගේ හැසිරීම් වර්තමාන සමාජ තත්වයන් හා ගැටීමට ලක් වී ඇත. බ්‍රිතාන්‍ය ආධිපත්‍යය විසින් උරුම කර දෙනු ලැබූ උප සංස්කෘතික වටිනාකම් (Sub Cultural Values ) නූතන සමාජ වටිනාකම් සමග ගැටීම හෝ විවේචනයට බඳුන් වීම අද වන විට දැකිය හැකිය. වෘත්තිය තුළත්, වෘත්තිකයන් හා සේවාදායකයන් තුළත් අපරාධ යුක්ති

විසර්ජන ක්‍රියාදාමය තුළ හා සමාජයේත් නිරන්තර විවේචනයට බඳුන් වේ. නඩු මගට පිවිසෙන විශාල පිරිසකගේ ගැටළු නිරාකරණය කරන සේවාවක් වෙළඳ ගුණයෙන් (Marketable) යුක්ත වීමට දරණ උත්සහය ප්‍රතිඵල ලෙස අපරාධ පාලනය හා ගැටළු නිරාකරණය උදාසීනව ඇත. එම ගැටළු වලට විසඳුම් සෙවීමේ කාර්ය .භාරය නිසි ආකාරයට ඉටු නොවීමෙන් සමාජ පර්යාය (Social Order) හා සමාජ ව්‍යුහය (Social Structure) විසංවිධානය වී (Disorganization) පුද්ගලයන් අතර නිරන්තරයෙන් ඝට්ටන හා අර්බුද වර්ධනය වී ඇත. මෙවැනි කරුණු ගණනාවක් ගැන අවධානය යොමු කර, පවත්නා ගැටළු හා ඊට විසඳුම් යම් ප්‍රමාණයකින් හෝ ඉදිරිපත් කිරීමට මෙම අධ්‍යයනය වැදගත් වේ.

## 1-2 අධ්‍යයනයේ අරමුණු

නීතිඥවරයාගේ කාර්යභාරය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී න්‍යායාත්මක හා ප්‍රායෝගික වටිනාකමකින් යුක්ත කරුණු ගණනාවක් දෙස අවධානය යොමු කළ යුතුය. පහත සඳහන් අරමුණු වඩාත් ප්‍රමුඛ වේ.

1. නීතිඥ වෘත්තියේ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීම.
2. බ්‍රිතාන්‍ය, ඇමරිකාව සහ ශ්‍රී ලංකාවෙහි නීතිඥ වෘත්තිය සුවිශේෂී ලක්ෂණ විමසා බැලීම.
3. නීතිඥ වෘත්තිය සහ නීති අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනය කිරීම.
4. නීතිඥ වෘත්තියේ වෘත්තිමය සමාජානුයෝජනය (Socialization) සිදු වන අයුරු හඳුනා ගැනීම.
5. නීතිඥවරයාගේ කාර්යභාරය විමසා බැලීම.
6. නීතිඥ වෘත්තිය සහ ආචාර ධර්ම (Ethics) පිළිබඳ අධ්‍යයනය කිරීම.
7. නීතිඥවරයාගේ කාර්ය භාරය කෙරෙහි සේවාදායකයින්ගේ දායකත්වය විග්‍රහ කර බැලීම.
8. අපරාධ පාලනය සඳහා අධිකරණ ධුරාවලිය තුළ නීතිඥවරයා කටයුතු කරන ස්වභාවය පැහැදිලි කිරීම.
9. නීතිඥවරයාගේ කාර්යභාරය කෙරෙහි සමාජයේ අදහස් හා ආකල්ප අධ්‍යයනය කිරීම.

## 1-3 අධ්‍යයනයේ සීමා

ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු පිළිබඳ මූලස්ථානය අළුත්කඩේ ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය කේන්ද්‍ර කොට පිහිටා ඇත. එහි තිබෙන උසාවි ප්‍රමාණය විසි ගණනක් ඉක්මවා ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය යනාදී වශයෙන් සියළුම අධිකරණ එකම බිමක පිහිටා ඇත. මේ සියළු අධිකරණ නිරීක්ෂණය කරමින් දත්ත එක් රැස් කිරීම ප්‍රායෝගිකව ගැටළු සහගතය. එබැවින් ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය සහ ප්‍රධාන මහාදිකරණයක් කෙරෙහි ඍජු ලෙස නිරීක්ෂණය කළේය. විශේෂයෙන් එම අධිකරණ නිරීක්ෂණය කොට ලබා ගන්නා ලද දත්ත සඳහා පමණක් සීමා කරගනු ලැබීය.

නීතිඥවරුන් විශාල පිරිසක් අපරාධ හා සිවිල් නඩු වශයෙන් ඉහත කී හැම අධිකරණයකම හෝ කිහිපයක පෙනී සිටියි. එබැවින් වර්ගීකරණයකට ලක් කිරීමකින් තොරව දත්ත සැපයීමට කැමැත්තක් දැක් වූ නීතිඥවරුන් අහඹු ලෙස තෝරා ගන්නට සිදු විය. නිශ්චිත ස්ථානයක දී හමු වනවාට වඩා ඔවුන් රුචි කරන ස්ථානයක දී සම්මුඛ සාකච්ඡා කළ හැකි අයුරින් අවිධිමත් ප්‍රශ්නාවලි උපලේඛණයක් සඳහා කාර්ය භාරය පිළිබඳ ප්‍රශ්න කිහිපයකට සීමා කර ගැනීමට සිදු විය.

විධිමත් සහ අවිධිමත් සම්මුඛ සාකච්ඡා සඳහා නීතිඥවරුන්ගේ ප්‍රමාණය ද සීමා කර ගැනීමට සිදු විය. අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට විවිධ වර්ගයේ සේවාදායකයන් ද සිටි බැවින් එහිදී ද සීමා පනවා ගන්නට සිදු විණි. ලබා ගත් සියලු දත්ත විග්‍රහ කරමින් එළඹුණු නිගමන වලට අනුව පර්යේෂණ නිබන්ධනය දීර්ඝ වන බැවින් අදාල කරුණු වලින් කොටසක් පමණක් තෝරා ගෙන එම කරුණු ඉතා කෙටියෙන් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී.

## 1-4 අධ්‍යයන ප්‍රදේශය හා නියැදිය තෝරා ගැනීම.

මෙම අධ්‍යයනය සඳහා කොළඹ නගරයේ ශ්‍රේෂ්ඨාධිකරණ මූලස්ථානය තෝරා ගැනීමට ප්‍රධාන කරුණු ගණනාවක් විය. එහිදී විශේෂයෙන් කොළඹ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අධිකරණ බල ප්‍රදේශය තුළ විශාල ජනකායක් නිරතුරුවම එහි පැමිණෙන හෙයිනි. කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමා වූ අධිකරණයන් මෙන්ම ශ්‍රී ලංකාව පුරාම විහිදී ගිය අධිකරණ බලය සහිත අභියාචනාධිකරණය හා මහාධිකරණය එහි පිහිටා තිබීම විශේෂ වැදගත්කමකින් යුක්තයි.

ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය සිය අධිකරණ කාර්යභාරයන් ඉටු කරන්නේ කොළඹ දී පමණි. කොළඹ අලුත්කඩේ උසාවි සංකීර්ණයට නොදුරින් මහාධිකරණයක් ඇත. එම මහාධිකරණයට අනුබද්ධිත උප උසාවි 7 ක් තිබේ. මහාධිකරණයට තරමක් නොදුරින් මහේස්ත්‍රාත් උසාවියක් තිබේ. එහි ඊට සම්බන්ධ උප උසාවි 4 ක් තිබේ. දිස්ත්‍රික් උසාවි 1 ක් හා එහි උප උසාවි 7 ක් ඇත. අභියාචනාධිකරණයක් ශ්‍රේෂ්ඨාධිකරණයක් නව චීන සමුභාණ්ඩු ගොඩනැගිල්ලේ පිහිටා ඇත.

ඉහත සඳහන් කළ අයුරින් අධිකරණ කටයුතු සඳහා වූ විවිධ වර්ගයේ අධිකරණ ප්‍රධාන හා උප කොටස් වශයෙන් 20 කට වඩා වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත. ඒ හැරෙන්නට නීති විද්‍යාලය, අධිකරණ සේවා කොමිසම, නීතිපති දෙපාර්තමේන්තුව ආදි නීති සහන සේවාවන් සපයන ආයතන ගණනාවක් ද පිහිටා ඇත. මේ එකිනෙක ආයතන වල විවිධ නිලතල වල නිරත විවිධ කාර්යභාරයන්හි යෙදෙන නීතිඥ වෘත්තිකයන් විශාල පිරිසක් මේ භූමිය තුළ නිරතුරුව දැකිය හැකිය.

ඔවුන් සරළ ලෙස පහත සඳහන් වර්ගීකරණයකට බඳුන් කළ හැකිය.

1. පෞද්ගලිකව වෘත්තියෙහි යෙදෙන්නන්

2. දේපළ පිළිබඳව කටයුතු කරන්නන්

3. වාණිජ, වෙළඳ, රක්ෂණ සමාගම් සම්බන්ධව කටයුතු කරන්නන්


4. සේවකයින්ගේ වන්දි හා ආරවුල් පිළිබඳ කටයුතු කරන්නන්

5. බදු මුදල් පිළිබඳව කටයුතු කරන්නන්

6. වෙනත්

ඉහත සඳහන් වර්ගීකරණයට ලක් කළ නීතිඥවරුන් හඳුනා ගැනීම පහසු කාර්යයක් නොවේ. එය ඉතා අසීරු කාර්යයක් බැවින් ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ දී සහ මහාධිකරණය අසල නිතර ගැවසෙන නීතිඥවරුන්ගෙන් අහඹු ලෙස තෝරා ගත් පනස් දෙනෙකු පමණ අධිකරණයෙන් බැහැරව සිටින අවස්ථාවලදී හා නීතිඥ කාර්යාල සංකීර්ණයේ දී ප්‍රශ්නාවලිය මගින් දත්ත ලබා ගනු ලැබිය. ඊට අමතරව එවැනි නීතිඥයින් වෙත තැපැල් මගින් යැවුණු ප්‍රශ්නාවලිය මගින් දත්ත ලබා ගනු ලැබිය. ඊට අමතරව එවැනි නීතිඥයින් වෙත තැපැල් මගින් යැවුණු ප්‍රශ්නාවලි වලින් ලද දත්ත හා පෞද්ගලිකව ඔවුන් වෙත ගොස් සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් දත්ත අධ්‍යයනය සඳහා උපකාරී විය.

ඒ හැරෙන්නට පොලිස් නිලධාරීන්, බන්ධනාගාර නිලධාරීන් හා විවිධ වර්ගයේ සේවාදායකයින් අහඹු ලෙස තෝරා ගෙන විධිමත් හා අවිධිමත් සම්මුඛ සාකච්ඡා මගින් නිරීක්ෂණය ප්‍රයෝජනයට ගෙන පර්යේෂණය සඳහා අදාළ දත්ත විග්‍රහ කරනු ලැබීය. ( වගු අංක 1-4) මෙ පිළිබඳ පරයෙක්ෂය සඳහා යොදා ගත් නියදිය මූලාශ්‍ර හා ක්‍රමවේදය ඉතා ගැඹුරින් විද්‍යාත්මකව. පෙන්වා දෙයි.



දත්ත රැස් කිරීම
ද්විතීය දත්ත
ප්‍රාථමික දත්ත
ආදනා
පොලිසිය
අධිකරණය
බන්ධනාගාර
පරිවාස
නීතිපති දෙපාර්තමේන්තුව
අධ්‍යනයේ අරමුණු
දත්ත රැස් කිරීම
නිරීක්ෂණ
විධිමත් හා අවිධිමත් සම්මුඛ සාකච්ඡා
ප්‍රශ්නාවලිය
දත්ත
1. ප්‍රකාශිත හා ප්‍රකාශිත නොකළ දත්ත
2. සඟරා
3. ලිපි ලේඛණ
4. රූප සටහන්
5. සංඛ්‍යා දත්ත
මහාධිකරණ අධි චෝදනීය නඩු
දිසා අධිකරණ සිවිල් නඩු
මහේස්ත්‍රාත් ලඝු නඩු
1. විනිසුරුවන්
2. නීතිඥවරුන්
3. පොලිස් නිලධාරීන්
4. බන්ධනාගාර නිලධාරීන්
5. පරිවාස නිලධාරීන්
6. විත්තිකරුවන්
7. පැමිණිලිකරුවන්
9. අධිකරණ නිලධාරීන්
නීතිඥවරයාගේ සමාජ-ආර්ථික පසුබිම
නීතිඥවරයාගේ නඩු වල ස්වභාවය
නීතිඥවරයාගේ කාර්ය භාරය
සේවාදයකයාගේ ආකල්ප
දත්ත විශ්ලේෂණය
නිබන්ධනය

# වගු අංක 4-1 (2)

| ද්විතිය මූලාශ්‍ර | ඇමරිකන් පුස්තකාලය | ශ්‍රී. ජ. වි. වි. පුස්තකාලය | පුස්තකාල සේවා මණ්ඩල | මහජන පුස්තකාලය | ජාතික ලේඛණ කෙෂ්ත්‍ර | නීතිඥ සංගම් පුස්තකාලය | බ්‍රිතාන්‍ය කවුන්සිලය |
|---|---|---|---|---|---|---|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා | √ | | √ | | | | √ |
| අධිකරණ ආඥා පනත් | √ | | | | | | |
| නීතිඥ වෘත්තිය පිළිබඳ ආධාර ධර්ම | √ | | √ | √ | | √ | |
| නීතිඥ වෘත්තිය ඉතිහාසය පිළිබඳ තොරතුරු | √ | √ | | | √ | √ | √ |
| අපරාධ යුක්ති පරිපාලන පද්ධතිය පිළිබඳ න්‍යායාත්මක කරුණු | √ | √ | | | √ | | √ |

# දෙවැනි පරිච්ඡේදය

## නීතිඥවරයාගේ අධිකරණමය කාර්යභාරයේ ඓතිහාසික පසුබිම

නීතිඥවරයාගේ අධිකරණමය කාර්යභාරය වුවද ඓතිහාසික විග්‍රහයක් කිරීමේ දී අපට පළමුව මෙම අධිකරණ ක්‍රමයට පාදක වූ බ්‍රිතාන්‍ය අධිකරණ ක්‍රමය හා ඇමරිකානු අධිකරණ ක්‍රමයේ ඉතිහාසය සම්බන්ධව වුවද පැහැදිලි කිරීම වැදගත් වනු ඇත.

නීතිඥ වෘත්තියෙහි අධිකරණමය ක්‍රමය කාර්ය භාරයෙහි ඓතිහාසික පසුබිම විග්‍රහ කිරීම තුළින් වර්තමාන තත්වය අවබෝධ කර ගැනීම පහසු වේ. බ්‍රිතාන්‍යයන්ගේ පාලන සමයේ හඳුන්වා දුන් වෘත්තීන් හා ආයතන අතරින් නීතිඥ වෘත්තිය (Legal Profession) සහ අධිකරණය (Court) ක්‍රමය ජන ජීවිතයේ අවශ්‍යම අංගයකි. සාමාන්‍ය පුරවැසියාගේ පටන් විවිධ තරාතිරම් වල ආයතන හා සංවිධාන වල ගැටළු නිරාකරණය කර ගැනීමට මේවායේ සහය අවශ්‍ය වේ. විශේෂයෙන් රටෙහි අපරාධ (Crime) සහ සිවිල් (Civil) වැරදි නිරාකරණය කර ගැනීම තුලින් සමාජ විසංවිධානය වලකා ගැනීම සඳහායි. සමාජ විද්‍යාඥයින් අපරාධ විද්‍යාඥයින් මෙවැනි පර්යේෂණ පිළිබඳ රටවල් කිහිපයක තත්වය සංසංදනාත්මකව විග්‍රහ කරයි. එහි දී විග්‍රහ කර පෙන්වන සමාජ ආර්ථික, දේශපාලන හා ආර්ථික පසුබිම තුල ජනිත වූ වෘත්තියෙහි අරමුණු හඳුනා ගැනීමට පහසු වේ.

මේ පරිච්ජේදයේ දී බ්‍රිතාන්‍යයේ නීති වෘත්තියෙ ආරම්භය විකාශනය මෙන්ම අධිකරණ ක්‍රමය හා නීති අධ්‍යාපනය පිළිබඳ ඉතිහාසය පෙන්වා දෙයි. එම රටාව පසුව ඇමරිකානු ජනපද යටත් වීමත් සමග එරටෙහි ව්‍යාප්ත වන අයුරු විග්‍රහ කරයි. අනතුරුව එරටට ආවේණිකව නීති අධ්‍යාපනය නීතිඥ වෘත්.තිය විකාශනය වී වර්තමාන තත්වය කරා පිවිසීම කෙටියෙන් පෙන්වා දෙනු ලැබේ.

ඉහත රටවල් දෙක තුල වූ පරිණාමික අවධීන් අපේ රටේ විකාශනය කෙරෙහි නිලීනව බලපා ඇති අයුරු කෙටියෙන් පෙන්වාදී අනතුරුව ආචාර ධර්ම පිළිබඳ සාකච්ජා කෙරෙයි. ආචාර ධර්ම නීතිඥ වෘත්තිය කෙරෙහි කුමන අයුරින් බලපානවාද, යන්නත් ආචාර ධර්ම වලට ආවේණික සීමාවන් බන්ධනය කිරීමෙන් ඇතිවන ප්‍රතිඵල හඳුන්වයි.

අවසාන වශයෙන් නීතිඥවරයාගේ කාර්යභාරයේ සමාජ විද්‍යාත්මක අපරාධ විද්‍යාත්මක පසු බිමට අදාල වන අධිකරණ ක්‍රියාදාමයේ දී ඔහුගේ ගමන් රටාව සිදුවන අන්දම අපරාධ නඩු සම්බන්ධව පෙන්වා දෙනු ලැබේ. මේ මගින් පසුව සාකච්ජා කරන නීතිඥ කාර්යභාරයේ මූලික ලක්ෂණ හඳුනා ගැනීමට පහසු වේ.

## 2-1 බ්‍රිතාන්‍යයේ නීතිඥ වෘත්තියෙහි විකාශනය.

ශ්‍රී ලංකාවේ පුරාතන අධිකරණ ක්‍රමය සැකසී තිබුනේ අපටම ආවේණික වු ආකාරයෙනි. පෘතුග්‍රීසි ලන්දේසි හා ඉංග්‍රීසි පාලනයන්ට නතු වීමත් සමග සිංහලයින්ට ආවේණික අධිකරණ පරිපාලන ක්‍රමය මුලුමණින්ම නැති වී ගියේය. එය සිංහලයේ අවසන් රාජධානිය වු නුවර යුගය අවසන් කරමින් උඩරට ගිවිසුම මගින් බ්‍රිතානය අධිකරණ පරිපාලනයට නතුවීමත් සමග සිදුවිය. මුල්ම බටහිර පන්නයේ නීතිඥ ස්වරූපයෙන් යුත් " පිස්කල් " (Piscl) නම් නිලධාරීන් යුක්තිය පසිඳලීමට ඉංග්‍රීසින් විසින් යොදවන්නට විය.

බ්‍රිතාන්‍යයේ වර්ධනය වු නීතිඥ වෘත්තිය ක්‍රමයෙන් ඇමරිකානු ජනපද වලට ද , දෙවනුව අනෙකුත් යටත් විජිත වලටද පැතිර ගියේය. බ්‍රිතාන්‍ය පර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ මුලික අංග අතර අධිකරණ ක්‍රමය ප්‍රමුඛ විය. මෙය ඉංග්‍රීසි නීතිය සමග තම යටත් විජිත වල ව්‍යාප්ත කළේය. මේ වන විට ලොව පුරා පවතින අපරාධ යුක්ති පරිපාලන ක්‍රමයන්හි නීතීඥ වෘත්තිකයින් ඉටු කරන කාර්යභාරය ඉතා පුළුල් විය. ඊට අමතරව වෙළඳ හා වාණිජ ක්ෂේත්‍රයේ ද ඉතා විශාල ලෙස නීතිඥ වෘත්තිය පැතිරී ගියේය. විශේෂයෙන් අපට වැදගත් වන අපරාධ වැලැක්වීම (Crime Prevention) සම්බන්ධයෙන් මේ වෘත්තියෙහි ආරම්භය, විකාශනය හා ව්‍යාපෘතිය අධ්‍යනය කිරීම ඉතාම වැදගත් වේ.

බ්‍රිතාන්‍යයේ ඇමරිකාවේ සිදු වු ඓතිහාසික විකාශනය සම්බන්ධයෙන් කෙටියෙන් හෝ විමසා බැලීමෙන් අප රටෙහි තත්වය ඉතා සරලව තේරුම්ගත් හැකිය. එය මෙරට අපරාධ විද්‍යාව හා අපරාධ යුක්ති පරිපාලන ක්ෂේත්‍රයෙහි වෘත්තිකයින් කරනු ලබන කාර්යභාරයන් එහි වගකීම හා සමාජයට, සමාජයෙහි අන්තර් සම්බන්ධතා වලට (Social Interaction) හා සමාජ පර්යාය (Social order) පවත්වා ගෙන යාමට කෙතරම් ඉවහල් වේදැයි වටහා ගැනිම සඳහා ප්‍රයෝජවත් වේ.

ඇන්ග්ලෝ සැක්ෂන් (Anglo Saction) නෝමන් (Norman) ටියුඩර් (Tuder) හා හැනෝවර් (Hanower) යන රාජ වංශයන් දක්වා බ්‍රිතාන්‍යයේ යුග පරිණාමය සිදු වුයේ අලිඛිත සිරිත්,විරිත් හා සම්ප්‍රදායන් මගින් සමාජය පාලනය වෙමිනි. මේ අවධීන් වල විධිමත් නඩු විසඳන ක්‍රමයක් දක්නට නොතිබිණි. අපරාධ හා සිවිල් යනාදී වශයෙන් වැරදි වර්ගීකරණයක්ද නොවිය. පළිගැනිමේ චේතනාව මත " ඇසට ඇස " " දතට දත " ලෙයට ලෙය " යනාදී හමුරාබි නීති ලක්ෂණ පෙන්නුම් කල සිරිත් මත දඩුවම් ක්‍රම සැකසී තිබිනි. වැරදි සිය ගණනක් සම්බන්ධයෙන් දඩුවම් පැමිණු විය. එහිදීත් වැරදි 200 පමණ සම්බන්ධයෙන් මරණ දඩුවම නියම කොට තිබේ. සිරිත් හා අලිඛිත නීතිවල වර්තමානයත් ප්‍රංශය, ඉතාලිය, ස්පාඤ්ඤය ආදී රටවල් අතර සිදු වු 30 අවුරුදු යුද්ධයත් ආර්ථික දේශපාලන හා සංස්කෘතිකමය වශයෙන් එම රටවල සිදු වු වෙනස්කම් ද බ්‍රිතානයයේ නෛතික හා අධිකරණ පරිපාලන ක්‍රමයන් හි වර්ධනයට මග පෑදීය. (මැරියට්, 1958. පි 1-177)

ඓතිහාසිකව බ්‍රිතාන්‍යයේ සිදු වු සමාජ පරිනාමයත් සමග ක්‍රි.ව. 1292 වන විටදී විනිසුරු වරුන්ගේ තත්වයේ නඩු විසඳු තැනත්තන් සිටි බව ප්‍රකාශ වේ. මේ සමයෙහි පලමුවන එඩ්වඩ් රජු රාජ්‍ය නායකයා විය.

ඔහුගෙන් පසුව රජ බවට පත් III වන එඩ්වඩ් රජු නඩුකාරවරුන් කෙරෙහි විශේෂ අවදානයක් යොමු කලේය. මේ අවධිය වන විට බ්‍රිතාන්‍ය, අයර්ලන්තය හා ස්කොට්ලන්තය තුල ජීවත් වු ජනතාව යුක්තිය සාධාරණත්වය සොයා නඩු මගට බැසීම ඉහල ගොස් තිබු බව පෙනේ. නඩු මගට පිවිසි විශාල පිරිසකට තමන්ගේ දුක් ගැනවිලි අධිකරණයන් හමුවේ කියා සිටින්නට හෝ ලියා දක්වන්නට දැනුමක් හෝ හැකියාවක් නොවිය. නඩු මගට පිවිසි විශාල පිරිසකට අකුරු ලිවීමට හෝ කියවීමට හැකියාවක් නොතිබු හෙයින් වැරදිකරුට චෝදනා කිරීමට හෝ සිදු වු හානිය පාඩුව පිළිබඳ කියා සිටින්නට නැතිනම් අයැද සිටීමට දැණුමක් හෝ නුවනක් නොවිය. තම තමන්ගේ අලාභය පාඩුව, වන්දිය අයකර ගැනිම සඳහා අධිකරණය හමුවේ කරුණු කියා පාන්නට නියෝජිතයකු අවශ්‍ය විය. (Encyclopeadia Britanica 1968 - 205) ඒ සඳහා දැණුම, නුවණ, හා කථිකත්වය ඇති පිරිසකගේ ඉදිරිපත් විම තුළින් නීතිඥ වෘත්තියට මග පෑදින.

එදා කතෝලික පල්ලියෙහි සේවය කළ බොහෝ දෙනෙකුට ලිවීමට කියවීමට දැණුමක් තේරුමක් තිබු හෙයින් ඔවුනටද මේ සඳහා ඉඩ ලැබුණි. විශේෂයෙන් පල්ලියෙහි ලිපිකරුවන් ගණයට වැටුන පිරිසට ද මේ අවස්ථාව හිමි විය. ඉහත සඳහන් පුද්ගලයින්ගේ එකතු වීමෙන් බ්‍රිතාන්‍යයේත් පසුව ඇමරිකාවේත් නීතිඥ වෘත්තිය ආරම්භ වු බව ඓතිහාසික මුලාශ්‍ර වලින් හෙලි කෙරෙයි. (Cohen : 1986: 60)

ඒ වන විටත් ගොඩ නැගී තිබුනු නීතිය අලිඛිත වු බැවින් ඉතා සංකීර්ණ විය. සම්ප්‍රදාය හා සිරිත් මගින් පුද්ගල චර්යාවන් පිලිබඳ විනිශ්චයන් තීරණය විය. මේ ගැඹුරු නීතිය තුලින් පුද්ගලයාගේ අයිතීන් සුරක්ෂිත කර ගැනීමේ ක්‍රියාදාමය සැකසී තිබිනි. එදා වුවද චෝදනා ලත් පුද්ගලයින් වෙනුවෙන් කරුණු ගෙනහැර දැක්වීම (Plead) පැවතියේය. වරද පෙන්වාදීමෙන් පසුව අධිකරණය හමුවේ එය පිළිගැනීම (Plead Guelty) යනුවෙන් හැදින් විය. (Keith, 1987: 169 - 177)

ස්කොට්ලන්තය, අයර්ලන්තය වැනි දුර පලාත් වලින් නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ පැමිණෙන සේවාදායකයින් පිරිස දිනෙන් දින වර්ධනය වුයේය. ඉතා දුර ගෙවා පැමිණෙන විශාල පිරිසකට නියමිත දිනට වෙලාවට, අධිකරණය හමුවේ පෙනී සිටීමටද නොහැකි විය. මෙවැනි අපහසුතාවලට ද පත් වු පිරිස වෙනුවෙන් කටයුතු කිරීමට, පෙනී සිටීමට, උත්තරවාද ඉදිරිපත් කිරීමට ඉඩකඩ සලසා දී තිබු නිලධාරීන් පිරිස හඳුන්වනු ලැබුවා වු නාමය වුයේ " ඇටර්නි " (Attorney) යනුවෙනි. (Eddey 1987 :PP 1 - 11)

මේ කාලය වන විට අධිකරණයන් හී පෙනී සිටි පිරිස සමාජයෙහි ප්‍රබුද්ධ (Elite Group) කොටසක් ලෙස නැගී එන්නට විය. සමාජයෙහි ඉහළ ස්ථරායනයක සිටි පිරිස අතර සාමි වරුනට ලැබෙන්නේ ඉහලම ගෞරවයකි. අධිනීතිඥවරුන් ලෙස සාමි මන්ත්‍රී මණ්ඩලයට පත් වු බොහෝ දෙනෙකු පසු කාලීනව ඉතා ප්‍රකට නීති ආයතන වලින් උගත් අය වුහ. පහලොස් වන ශත වර්ෂය වන විට, 13 වන හා 14 වන ශත වර්ෂ වල රජකළ පලමුවන ජෝර්ජ් රජු හා III ජෝර්ජ් රජ වරුන් ගේ රාජ්‍ය සමයන්හී වර්ධනය කළ නීතිඥ වෘත්තිකයින් සමාජයෙහි ප්‍රබුද්ධයන් ලෙස සංගම් හා ශ්‍රේණි (Elite & Guild) යනුවෙන් සංවිධාන පිහිටුවාගෙන එකරාශී වී සිටියහ. මේ සංවිධානයන් දෙක විසින් තමන්ගේ වෘත්තීමය කටයුතු කිරීම සඳහා ස්ථානයක් ගොඩ නගා

ගැනීමට කටයුතු කළේය. එදා වෙස්මිනිස්ටර් අධිකරණය ගොඩනගා තිබූ ස්ථානයත් ලන්ඩන් නගරයෙහි තේම්ස් ගංගාවට උතුරෙන් පිහිටි ඉඩම් රජයෙහි අවසරයෙන් අත්පත් කර ගත්තේය. මෙසේ අයත් කරගත් ඉඩමෙහි " ලින්කන් ඉන් " (Lincone Inn) " ග්‍රේස් ඉන් " (Grays Inn) සහ මිඩල් ටෙම්පල් (Middle Temple) යන නාමයන්ගෙන් එංගලන්තයෙහි පමණක් නොව ලොව පුරා ප්‍රකට සතර මහ (අධිනීතිඥ) ආයතනයන් (4 Inns of Court ) ඉදි කරන්නට යෙදුනේය. (ජයතිලක 1997, පි.36) මෙම නීති ආයතනයන් හී පාලනය භාරව සිටි ප්‍රධානියා හඳුන්වනු ලැබුයේ " බෙන්චර්" (Bencher) හෙවත් " පාලක තැන " යනුවෙනි.

පසු කාලීනව ඉතා ප්‍රකට හා ජාත්‍යන්තර කීර්තියට පත් මෙම නීති ආයතන 4 ට නුදුරින් " චාන්සරි " නම් වූ ස්ථානයෙහි වෙනත් නීති ආයතන දාහයක් පමණ ආරම්භ කරන ලදී. මේ චාන්සරි නීති ආයතනයන්ට වඩා පහසුකම් ප්‍රධාන නීති අධ්‍යයන ආයත හතරෙහි විය. මෙම සතර මහ නීති ආයතන වල නීති අධ්‍යාපනය ලැබීමට ඉඩකඩ හා අවසර ලැබුනේ ආර්ථික හා සාමාජිය හා දේශපාලනමය වශයෙන් බ්‍රිතාන්‍යයේ, ස්කොට්ලන්තයේ සහ අයර්ලන්තයේ ප්‍රභූ පිරිසගේ පවුල්වල දූ දරුවනට පමණි. ඊට අමතරව මෙහි අධ්‍යාපනය ලබන නීති ශිස්‍යයින් අනිවාර්යයෙන්ම නේවාසිකව අධ්‍යාපනය ලැබිය යුතු විය. මෙහි සියලුම ශිෂ්‍යයන් සාමාජිකයින් ලෙස සැලකූහ. එපමණක් නොව ඔවුන්ගේ නීති අධ්‍යාපනය න්‍යායන් හතර සඳහා වෙන වෙනමම පුස්තකාල හා අවශ්‍ය පහසුකම් සලසා තිබුණේය. ආපන ශාලා ඇතුලු අනෙකුත් බාහිර පහසුකම් ද සලසා තිබිණි.

නේවාසිකාගාරවල නැවතී සිටි නීති ශිෂ්‍යයින් නීතිය පිළිබඳ සාකච්ඡා කිරීම අදහස් හුවමාරු කර ගැනීම හා ආහාර ගැනීම මගින් එක සංවිධානයක සාමාජිකයින් ලෙස ඒකරාශී වීමට ඉඩකඩ සලසා තිබිනි. නීතිය පිළිබඳ දේශනා කරනු ලැබුවේ දක්ෂ කථිකාචාර්ය වරුන් සහ මහාචාර්ය වරුන් විසිනි. දේශන පන්ති වලට අමතරව සාකච්ඡා සම්මන්ත්‍රණ වලට ශිෂ්‍යයින් සහභාගි කරවීය. එදා වන විටත් ඉතා ඉහල මට්ටමින් " නීති තර්ක ඉදිරිපත් කිරීමේ පුහුණුව " (Advocacy) ලබාදීම මගින් දක්ෂ නීති ශිෂ්‍යයින් බිහි කිරීමේ අරමුණු පැවති බව පෙන්වා දිය හැක. (OXFORD English Dictionery, 1961 ( 120 - 121)

ඉහත නීති අධ්‍යාපන ආයතන හතරෙහි අධ්‍යාපනය ලැබූ දක්ෂ කුසලතා හෙබි සාමාජිකයින් උසස් මට්ටමේ දැනුමක් හා පුහුණුවක් තිබුන පුද්ගලයින් සේ සැලකිණි. එවන් කුසලතා පුණ් නීති ශිෂ්‍යයින්ට ආමන්ත්‍රණය කිරීම සඳහා " සාර්ජන්ට් " (Serjeants) යන ගෞරව නාමය ව්‍යවහාර කරන්නට යෙදින. මෙවැනි දක්ෂ ශිෂ්‍යයින් ඉන් පසුව ආධුනිකයින් ලෙස (Apprenties) වශයෙන් විනිශ්චයකාර වරුන් යටතේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම සඳහා යවනු ලැබිය. මෙම සාර්ජන්ට් සහ ආධුනික යන දෙකොට්ඨාශයකටම ජ්‍යෙෂ්ඨයකු යටතේ පුහුණුව ලැබීමෙන් අනතුරුව ලිඛිත පරීක්ෂණයකට පෙනී නොසිට " බැරිස්ටර් " (Barrister) හෙවත් අධිනීතිඥ වරයෙකු වීමට අවසර ලබා දුන්නේය.

බ්‍රිතාන්‍යයේ පැවත ආ සිරිත අනුව රජතුමා තීරණ ගනු ලැබුයේ මැති ඇමතිවරුන්ගේ උපදෙස් වලට ගරු කරමිනි. එසේ උපදෙස් (Counsel) ලබා ගැනීමේ පුරුද්ද බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තුල පවා පැවතිනි. මෙසේ පැවතියා වූ සම්ප්‍රදායට ගරු කරන්නාක් මෙන් අධිකරණ ක්‍රමය තුල ද නීති තර්ක ගෙන හැර දක්වමින්

ඉතා දක්ෂ ලෙස අධිකරණය හමුවෙහි නඩුවක් මෙහෙය වීමේ කාර්යභාරය පැවරුණේ අධිනීතිඥ (Barrister) වරයා වෙතය. අධිකරණය ඉදිරියෙ මෙවැනි උපදේශන කාර්‍යභාරයක් ඉටුකල වෘත්තිකයෙකු ලෙස ඔහු (Cuncil) යන නමින්ද හදුන්වන්නට විය.

ඉහත අධිකරණයන්හි පෙනී සිටි අධිනීතිඥ වරුන් සඳහා සුවිශේෂ වූ නිල ඇඳුම් නීතිඥ වෘත්තියෙහි ආරම්භයත් සමගම තීරණය කරන්නට යෙදුනි. කමිසයෙහි කර ලගින් බෙල්ලෙන් පහලට එල්ලෙන සුදු පටියක් පැලදීම සහ කළු කබායක් (Black Coat) වැසෙන අයුරින් කළු ලෝගුවක් (Gown) පැළඳීමට නියම විය. මහෙස්ත්‍රාත් අධිකරණයකදී හැරෙන්නට හිස් වැස්මක් (Whig) පලදින ලදී. (ජයතිලක 1997 පි. 38) නිල ඇඳුමින් පවා නීති ශාඛාවන් දෙක වෙන් කොට දැක්වීම ආරම්භක අවධියේ සිට මධ්‍යකාලීන යුගය දක්වා දිව එන්නට විය.

චාන්සරි නම් ඉහත දැක් වූ නීති ආයතන වල සිටි සාමාජිකයින් " ඇටර්නිවරුන් " (Attorney ) නමින් හැදින්විය. බැරියස්ටර් (Barrister ) වරුන්ගේ නීති ආයතන වලට ඇටර්නි වරුනට ඇතුලත් විය නොහැකි විය. එකල පැවති අධිකරණවල විනිශ්චයකාරවරුන් සහ නීති ආයතන වල ප්‍රධානීන් විසින් ඉහළ, අධිකරණවල නඩු කටයුතු සඳහා සේවාදායකයින් වෙනුවෙන් පෙනී සිටීමට ඉඩ දෙනු ලැබුයේ අධිනීතිඥ වරුනට ( Barrister ) පමණි. ඒ වන විට ඇටර්නි වරුනට පැවරී තිබුන කාර්යභාරය වූයේ සිවිල් නඩු වලට අදාල සිතාසි නිකුත් කිරීම ආදී කටයුතුවල සිට ලිපිකරුවකුගේ කාර්යභාරය දක්වා වූ සියල්ල ඉටු කිරීමට පමණක් විය.

16 වන සියවස වන විට අධිනීතිඥ වරුන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වන්නට විය. මොවුන් සේවදායකයින්ගේ නඩු කටයුතු ඔවුන් සමග සාකච්ඡා කොට උපදෙස් දීම ආදිය මගින් මග පෙන්වීමේ කටයුතු වල මූලිකම කාර්යය කළ නියෝජිතයින් පිරිස වූහ. 17 වන ශත වර්ෂය වන විට ඔවුහු තම කාර්යභාරය ක්‍රමානුකූලව නඩු මගට පිවිසි සේවාදායකයින්ට ඉටු කරන්නට වූහ. එහි ප්‍රතිඵල ලෙස ජනතාවගේ යුක්තිය පසිඳලීමට සහය වන්නන් වූ මේ පිරිස " සොලිසිටර්වරු " වශයෙන් හදුන් වන්නට විය. " සොලිසිටර් " යන්නෙහි තේරුම නම් " මහත් ඕනෑකමින් ඉල්ලා සිටීම " යනු " නඩු සොයා යාමයි " (ජයතිලක 1997 පි. 37) තවත් සරලම අදහස නම් සේවාදායකයින් සොයා ගොස් ඔවුනට කරුණු පැහැදිලි කොට නඩු සඳහා පෙළඹ වීමයි.

කේම්බ්‍රිජ් ඔක්ස්ෆඩ් සහ අනෙකුත් විශ්ව විද්‍යාල වල රෝම නීතිය හා දේව ධර්මය ඉගෙන ගනු ලැබූ සමහර අය පල්ලියේ පූජා ප්‍රසාදි තැනගේ අවසරය ලබා ගෙන ප්‍රොක්ටර් වරුන් ලෙස කටයුතු කළේය. රෝමයේ ආරම්භ වූ මෙම ප්‍රොක්ටර් ( Proctor ) වරුන්ගේ කාර්යභාරය ඉටු කිරීමට තිබිය යුතු සුදුසුකම වූයේ දක්ෂ කථිකත්වය හා අනුන් වසග කර ගැනීමේ හැකියාවයි. වෙනත් කෙනෙකුගේ මුදල් හා මූල්‍යමය වගකීම් සම්බන්ධයෙන් කටයුතු කළ තැනැත්තාද හඳුන්වනු ලැබුයේ ප්‍රොක්‍යුරේටර් (Procurator) යනුවෙනි. 1873 - 1875 කාලයේ දී සම්මත කරන ලද අධිකරණ සංවිධාන පනත මගින් ගෙනෙන ලද සංශෝධනයන් සමගම ප්‍රොක්ටර් වරුන්ගේ නිලය අභාවයට ගියේය. වර්තමානය වන විට ප්‍රොක්ටර් නමින් නීතිඥ වෘත්තියෙහි යෙදෙන කිසිවකුත් බ්‍රිතාන්‍යයෙහි දැකිය නොමැත. (ජයතිලක 1997 : 39 )

බ්‍රිතාන්‍යයේ උත්තරීතර අධිකරණ අතරින් මහාධිකරණයේ දී සේවාදායකයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් උපදෙස් දීම බැරිස්ටර් වරයෙකුගේ කාර්යභාරය විය. මහාධිකරණ විනිශ්චයකාර වරුන්ගේ නිර්දේශය මත බැරිස්ටර් වරයෙකු විභාගයකට ඉදිරිපත්ව ඉන් සමත් වු පසු සොලිසිටර් කෙනෙකු ලෙස මහාධිකරණයන් හි පෙනී සිටීමේ අවසරය වර්තමානය වන විට ලැබී තිබේ. මහාධිකරණයක විනිශ්චයකාර වරුන් ලෙස බොහෝ විට පත්වීම හිමිකර ගනු ලබනුයේ බැරිස්ටර් වරුන්ය. පසු කාලය වන විට එම තත්වය වෙනස් වී " සොලිසිටර්වරු " මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සිට අනෙකුත් උසාවි වල විනිසුරුවන් වීම දක්වා පුළුල් කළේය. මහධිකරණයක සේවය කිරීමෙන් ලැබු උගත් බුද්ධිමත් භාවය, දක්ෂතාවය කාර්යක්ෂම හා ජේෂ්‍යඨත්වය හේතු කොට ගෙන බැරිස්ටර් වරුන් පසු කාලයේ දී " රාජනීතිඥ " නම් වු නම්බු නාමයෙන් පිදුම් ලැබීමට පවා හැකි විය. ඒ අනුව ක්‍රි.ව. 1603 දී ප්‍රථම වරට ශ්‍රීමත් ප්‍රැන්සිස් බේකන් (Sir Francis Bacon) එම නම්බු නාමය ලැබු පළමු අධිනීතිඥවරයා ලෙස විශ්ව කීර්තියට පත්විය. (ජයතිලක 1997 : 64)

ඉහත සඳහන් අයුරින් විකාශනය වු නීති විද්‍යාල නීති අධ්‍යාපනය නීතීඥ වෘත්තිය පසු කාලීනව තම යටත් විජිත වල නීති වෘත්තීන්හි ඇරඹුමට මග හෙලි කළේය. එපමණක්ද නොව එම රටවල ප්‍රචලිත සිරිත් විනිශ්චය කොට ඉංග්‍රීසි නීතිය හෝ රෝම ලන්දේසි නීතිය ක්‍රියාත්මක කරවීමට උනන්දු වුහ. මෙසේ බ්‍රිතාන්‍ය නීති අධ්‍යාපනය නීති විද්‍යාල වල ආකෘතිය, ඉංග්‍රීසි නීතිය හා නීති වටිනාකම් හා උප සංස්කෘතිය අපගේ සංස්කෘතිය තුලට වියරණය කරනු ලැබුවේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදීය. මේ තත්වය තුල හැම විටම අපේ නීතීඥ වෘත්තිය ගැටළු විසඳා ගැනිමට උපාය මාර්ග බ්‍රිතාන්‍යයෙන් ලබා ගන්නට වැයම් දැරූහ. ඒ පිළිබඳ ඓතිහාසිකව අවබෝධයක් ලැබීමෙන් අනතුරුව අප රටේ නීතීඥ කාර්යභාරය තේරුම් ගැනීමට පහසු වේ.

## 2.2 ඇමරිකාවේ නීතිඥ වෘත්තියෙහි ඉතිහාසය

ඇමරිකානු නීති විකාශනයෙහි ඉතිහාසය තුළ සිදු වු වෙනස්කම් පසුකාලීව මෙරට නීතිඥ වෘත්තිය කෙරෙහි ද වෙනස්කම් සිදු කිරීමට හේතු විය.

- **යටත් විජිත සමය**

බ්‍රිතාන්‍යයේ ආධිපත්‍යයට නතුව තිබු ඇමරිකානු යටත් විජිතයේ මුල් වසර කිහිපය තුළ දී නීතිඥවරු නොවුහ. වසර ගණනාවක් ගතවීමත් සමග ඉතාමත් අල්ප නීතිඥ වරුන් පිරිසක් සිටි බව පැවසේ. ක්‍රමයෙන් ඇමරිකානු සමාජය සංවර්ධනය වෙමින් පැවතියද සමාජය සංකීර්ණවීමත් සමග සමාජ ප්‍රශ්ණ වර්ධනය වන්නට විය. පුද්ගලයින් අතර සංකීර්ණ ගැටලු හට ගැනිමත් සමගම නීතිඥවරු සමාජයට අත්‍යාවශ්‍ය පිරිසක් බවට පත් වුහ. මේ අවධිය වන විට නීතිඥ වෘත්තිය කෙරෙහි ආශාවක් තිබු අයට පුරුදු පුහුණු වීම සඳහා නීති විද්‍යාල නොතිබුනාහ. ඇමරිකානු ජනපද වල නීති විද්‍යාල නොතිබුණු හෙයින් විශේෂයෙන් දකුණු ප්‍රදේශයේ වාසය කළ තරුණ පිරිස ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා එංගලන්තයට ගියහ. එකල එංගලන්තයේ උසාවි තුලම

තිබුනා වූ ඉන් (Inn) වලට ඇතුලත් වූහ. ඉන් (Inn) යනුවෙන් හැඳින්වූයේ ක්‍රමානුකූල නීති විද්‍යාල නොවුනත් එහි දී ශිෂ්‍යයනට ඉංග්‍රීසි නීතිය පිළිබඳව හඳුනා ගැනීමට හැකි වනසේ ඉංග්‍රීසි නීති (English Law) සංස්කෘතියක් පැවතියේය. (Encyclopeadia Americana : 197)

මේ කාලයේ නීතිය ඉගෙන ගැනීමට අපේක්ෂා කළ ඇමරිකානුවෝ ප්‍රසිද්ධ දක්ෂ, නීතිඥවරයෙකු යටතේ ලිපිකාරවරයෙකු ලෙස හෝ ආධුනිකයෙකු ලෙස කටයුතු කළහ. වෙනත් ආකාරයකින් පවසන්නේ නම් මෙම සිසුන් තමන්ව පුහුණු කරවනු ලබන නීතිඥ වරයාට මුදල් ගෙවිය යුතු විය. (Ibid 206) සමහරු මේ ක්‍රමය ප්‍රයෝජනවත් ලෙස සැලකූහ. තවත් සමහරෙක් එම ක්‍රමය ඵල රහිත වටිනාකමක් නැති ක්‍රමයක් ලෙස චෝදනා මුඛයෙන් කථා කළහ. නීතිඥ මණ්ඩලයට (The Bar ) ඇතුළු වීමට සෑම ඇමරිකානු කොලනියකටම ආවේනික වූ විවිධ මට්ටම් පැවිණියේය. ඒ ඒ කොලනියේ වූ සෑම නීතිඥවරු කණ්ඩායමකටම, එහි වූ උසාවි වල නීතිය පුහුණු වීමට අවසරය ලැබුනේය.

## ◆ නීතිඥවරු සහ නීති වෘත්තිය :

නීතිඥ වෘත්තිය පිලිබඳව සාකච්ඡා කරන විට ප්‍රධාන වශයෙන් එක්සත් ජනපදයේ ඇටර්නි වරුන්ගේ කාර්යභාරයත් පුහුණුවත් වැදගත් වේ. මේ සඳහා නීති වෘත්තියෙහි යටත් විජිත සමයේ පැවති යම් යම් සීමා පුළුල් විය. මුලදී නීතිඥ මණ්ඩලයට ඇතුළු වීම සඳහා බලපත්‍ර ලබා ගැනීමට කොලනියෙ උසස්ම උසාවියට යා යුතු විය. ඇමරිකා එක්සත් ජනපදයේ මැසචුසෙට්ස් (Massachusetts) හි පැවති උසාවි වලට ඇතුලත් කර ගනු ලැබුවේ ඔවුන්ගේ අධිකරණ ක්‍රමයට ආවේණික වූ නීතිඥවරු පමණි. " රෝඩ් දිවයිනේ " (Island Road) ඕනෑම උසාවියකට ඇතුළත් වී කටයුතු කිරීමට නීතිඥවරුනට අවසර ලැබුනේය. කොලනියෙහි පැවති එක් එක් උසාවියට වෙන වෙනම ඇතුළත් වුවද ඉන් නිරායාසයෙන්ම අර්ථවත් වූයේ කොලනියෙහි ඕනෑම උසාවියකට ඇතුලත් වී නඩු කටයුතු මෙහෙය විය හැකි බවයි (Robert, 1971 : 85)

යටත් විජිත සමයේ සිට බ්‍රිතාන්‍යයට ගොස් නීති අධ්‍යාපනය ලැබුවන් සහ ඇමරිකාවේ කොලනි වල නීති අධ්‍යාපනය ලැබූ වෘත්තියෙහි යෙදෙන පිරිස් ක්‍රමයෙන් වර්ධනය වන්නට විය. ඒ ඒ ප්‍රයත්නයන්හි පැවති අධිකරණ රටාවනට අනුගතව යුක්තිය පසිඳලීමට නීතිඥවරු කැප වී සිටියහ. එපමණක් නොව ඇමරිකානු දේශපාලන පද්ධතිය තුල විශාල කාර්යභාරයක් කිරීමට උරදුන් අය අතර නීතිඥවරු ප්‍රමුඛයෝ වූහ. ඇමරිකානු නිදහස් සටන සඳහා ද මොවුහු දායක වූහ. (Robert, 1971 : 89) ඇමරිකානු නිදහස් සමයෙහි පෙරමුණු ගෙන කටයුතු කළ පිරිස 50 දෙනෙකු පමණ සිටි බව දැක්වේ (Ibid. 89) ඉන් 25 දෙනෙකු පමණ නීතිඥවරු වූහ. පලමුවෙන්ම ක්‍රියාත්මක වූ විශ්වාසදායක සංගමයේ වූ නියෝජිතයන් 55 දෙනා ගෙන් 31 දෙනෙකුම නීතිඥවරු වූහ. (Ibid : 90 ) ඇමරිකානු සමුහාණ්ඩුව පිහිටුවීම සඳහා ප්‍රමුඛව ක්‍රියා කළ අය අතර ජෝන් මාර්ෂල් (John Marshall) ජෝන් ඇඩම්ස් (John Adams) තෝමස් ජෙපර්සන් (Thomas Jefferson) ජේම්ස් විල්සන් (James Willson) ජෝන් ජේ (John Jay) සහ ජෝර්ජ් විත් (George Wythe) යන අය ඉන් කිහිප දෙනෙකු ලෙස සඳහන් කළ හැකිය.